# කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**2022 අධ්‍යයන වර්ෂයට අදාළව උපාධි පාඨමාලා (බාහිර) සඳහා ලියාපදිංචි කිරීම**

2022 අධ්‍යයන වර්ෂයට අදාළව පහත සඳහන් උපාධි පාඨමාලාවන් සඳහා ලියාපදිංචි කිරීමට තෝරාගත් අතිරේක ශිෂ්‍ය නාම ලේඛනය (Additional List) අපගේ වෙබ් අඩවියේ (www.cdce.kln.ac.lk) 2023 **මැයි 08 දින** පළ කිරීමට නියමිතය.

| පාඨමාලාව | පාඨමාලා ගාස්තුව (මෙය වාරික 05කින් ගෙවීම් කළ හැකිය) | ලියාපදිංචි කරගැනීම සඳහා වන පළමු වාරිකය |
|---|---|---|
| වාපාර කළමනාකරණවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව | රු. 120,000.00 | රු.25,000.00 |
| වාණිජ විද්‍යාවේදී විශේෂ (බාහිර) උපාධි පාඨමාලාව | රු. 162,500.00 | රු.44,000.00 |
| ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව | රු. 86,000.00 | රු.15,000.00 |

ලියාපදිංචි වීම සඳහා පළමු වාරික මුදල ගෙවිය යුතු අතර ඒ සඳහා පහත මාර්ගෝපදේශ අනුගමනය කරන්න.

1. මුලින්ම අපගේ **www.cdce.kln.ac.lk** යන වෙබ් අඩවියට පිවිසෙන්න. එහි **"Selected Lists and First Installment Payment – 2022 Academic Year"** නැමති අයිතමය තෝරාගන්න.
2. ඉන්පසු ඔබගේ අයදුම්පත් අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න.
3. එවිට ඔබට හිමි වවුචර්පත, ප්‍රකාශන පත්‍රය, නම, ලිපිනය සහ ඔබට අදාළ පාඨමාලාව සඳහන් පත්‍රිකාව මෙන්ම වාරික ගෙවීම් පිළිබඳ විස්තර පත්‍රිකාව දිස්වනු ඇත. එම පත්‍රිකාවේ සඳහන් තොරතුරු නිවැරදි බව ඔබ විසින් තහවුරු කිරීමෙන් අනතුරුව ඔබගේ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් උඩුගත (Upload) කරන්න. ඉන් පසු ඉහත ලේඛන බාගත (Download) කරගන්න.
4. වවුචරයේ දක්වා ඇති උපදෙස් අනුව අදාළ මුදල වවුචරයේ සඳහන් **ගිණුම් අංකයට පමණක්** ගෙවිය යුතුය.
5. පළමු වාරික මුදල මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට 2023.05.31 දිනට පෙර ගෙවිය යුතුය. **(කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ගිණුමට බැර කරනු ලබන කිසිඳු මුදලක් ආපසු ගෙවනු නොලැබේ.)**
6. මෙම දිනට හෝ ඊට පෙර ගෙවීම් නොකරන අපේක්ෂකයින් ලියාපදිංචිය සඳහා සලකා බලනු නොලැබේ.
7. මුදල් ගෙවීමෙන් පසුව බැංකුව විසින් ඔබ වෙත ලබාදෙනු ලබන කහ පැහැති පාරිභෝගික පිටපත සමග නිසි පරිදි අත්සන සහතික කරන ලද ප්‍රකාශන පත්‍රය, නිරවද්‍යතාවය තහවුරු කරන ලද තොරතුරු අඩංගු පත්‍රිකාව සහ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 02ක් සමග පහත ලේඛනවල සහතික කරන ලද ඡායා පිටපත් අනිවාර්යයෙන් එවිය යුතුයි.

- **උප්පැන්න සහතිකය,**
- **ජාතික හැඳුනුම්පතේ පිටපතක්**
- **අ.පො.ස (සා.පෙළ) සහතික**
- **අ.පො.ස (උ.පෙළ) සහතික**
- **වෙනත් සුදුසුකම් යටතේ ලියාපදිංචි වන්නේ නම් අදාළ සහතිකය**
- **පූජ්‍ය පක්ෂය සඳහා සාමණේර හෝ උපසම්පදා සහතිකය.**

තව ද උප්පැන්න සහතිකයේ සහ අධ්‍යාපන සහතිකවල නම් අතර වෙනසක් පවතී නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

**ප්‍රකාශන පත්‍රයේ අත්සන සහ ලේඛනවල ඡායා පිටපත් සහතික කිරීම**

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරී / සාමදාන විනිශ්චයකාරවරයෙකු / නීතීඥවරයෙකු හෝ රජයේ පිළිගත් ආයතනයක මාණ්ඩලික නිලධාරියෙකු විසින් සිදු කල යුතුය.

8. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"Registration - 2022"** ලෙස සඳහන් කර 2023.06.07 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කරන්න.

**ලිපිනය :-** **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,**<br>
**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,**<br>
**තැ.පෙ. 03,**<br>
**කැලණිය විශ්වවිද්‍යාලය,**<br>
**කැලණිය.**

9. ඔබ ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වන්නේනම් ඔබට ලබා දී ඇති විෂයයන් සඳහා බාහිර උපාධි අපේක්ෂකයින් අවම වශයෙන් 20 දෙනෙකුවත් ලියාපදිංචි නොවුනහොත් ලබා දිය හැකි වෙනත් විෂයයක් සඳහා මාරුවීමට සිදු වන බව දන්වමි.

> ඔබ ලබා දී ඇති තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත් වුවහොත් ඔබගේ ලියාපදිංචිය අවලංගු කරන බව දන්වන අතර ගෙවා ඇති කිසිඳු මුදලක් ආපසු නොගෙවන බව ද වැඩිදුරටත් දන්වමි.

- **2023 පෙබරවාරි මස 28 දිනට පෙර අයදුම්කර, තෝරාගත් පළමු නාම ලේඛනයෙහි නම සඳහන් එහෙත් මේ දක්වා පළමු වාරික මුදල් නොගෙවූ අපේක්ෂකයින්ට ද මෙම කාලසීමාව තුළ අදාළ ගෙවීම් සිදුකළ හැක.**
- **තවද ඉහත සඳහන් උපාධි පාඨමාලාවන් සඳහා මේ දක්වා අයදුම් කිරීමට නොහැකි වූ අපේක්ෂකයන්ට 2023 මැයි 08 දින සිට 2023 මැයි 31 දින දක්වා ඒ සඳහා අයදුම්කළ හැක.**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,<br>
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය.<br>
කැලණිය විශ්වවිද්‍යාලය<br>
2023.05.04